47

# සිංහලයේ අර්ධ අනුනාසික්‍ය ශබ්ද පිළිබඳ විමර්ශනයක්

*දේවානන්ද හිමි, තමාඩුවේ* [1]

අක්ෂර හැටකින් යුත් නූතන සිංහල හෝඩියේ ඇතුළත් 'ඟ, ඦ, ඬ, ඳ, ඹ' යන පසකුරු සඤ්ඤකාක්ෂර, අර්ධ අනුනාසික්‍යාක්ෂර යන නම්වලින් හැඳින්වේ. භාෂණ සිංහලයේ ඒ ගණන ද ඉක්මවන බැව් ස්වර නාසික්‍යකරණය (Nasalization) මඟින් විශද වේ. කිසි විටකත් හල් ව නොයෙදෙන මේ අක්ෂර අතුරෙහි ''ඦ'' යන්න ඉතාමත් විරල වශයෙන් ද සෙසු අක්ෂර බහුල වශයෙන් ද ව්‍යවහාර වේ. සිංහල භාෂා ඉතිහාසයේ මධ්‍යතන සිංහල අවධියේ සිට සඤ්ඤකාක්ෂර භාවිත විය. පෙණහල්ලේ සිට එන වායු ධාරාව උච්චාරණේන්ද්‍රිය පද්ධතිය තුළ දී විවිධ බාධා කිරීම්වලට භාජන වෙයි. එම වායු ධාරාව නාසාරන්ධ්‍රය ඔස්සේ පමණක් ගමන් කරවීමෙන් නිපදවෙන ශබ්ද නාසික්‍ය ශබ්ද ලෙස ද සැලකෙන අතර වායු කලාපය යම් පමණකට නාසාරන්ධ්‍රය හා මුඛරන්ධ්‍රය ඔස්සේ ගමන් කරවීමෙන් නිපදවෙන ශබ්ද අර්ධානුනාසික්‍ය ශබ්ද ලෙස හැඳින්වේ. අර්ධානුනාසික්‍යාක්ෂර සංයුක්තාක්ෂර වුව ද අද්‍යතන ව්‍යවහාරයේ කේවල ශබ්ද විශේෂයක් කොට නූතන ශබ්ද විද්‍යාඥයෝ පහදති. ඔවුහු ඒ සඳහා ස්පෙක්ට්‍රොග්‍රාෆ් යන්ත්‍ර ද කිමෝග්‍රාෆ් යන්ත්‍ර ද යොදා ගෙන සූක්ෂ්ම පර්යේෂණ කොට ඔසිලෝමික් වාර්තා (Osicillomink) ඉදිරිපත් කොට ඇත්තාහ. ඓතිහාසික ව සංයෝග යක් ලෙස ද උච්චාරණය අනුව කේවල ශබ්ද වර්ගයක් ලෙස ද, මෙම සඤ්ඤක ශබ්ද පවතින්නේදැයි යන කරුණාද්වය විමසීම මේ පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථයයි. මේ සඳහා සඤ්ඤකාක්ෂර පිළිබඳ ලියැවුණු ශාස්ත්‍රීය නිබන්ධ හා විචාරාත්මක ලිපි ද සිංහල, පාලි හා සංස්කෘත යන භාෂාවන්හි ප්‍රාථමික ව්‍යාකරණ ග්‍රන්ථ ද තත් භාෂාවල ම ද්විතීයික මූලාශ්‍රයාදිය ද මුඛ්‍ය කොට ඇසුරු කෙරේ. මේ නයින් සැලකීමේ දී සඤ්ඤකාක්ෂර හුදු කේවල ශබ්ද කොට්ඨාසයක් ලෙස ද සිංහල භාෂාවේ සන්නිවේදනයෙහි ලා මේ අක්ෂරවලින් හා ශබ්දවලින් මනා පිටුවහලක් ලැබෙන බැව් ද ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ය.

ප්‍රමුඛ පද: සඤ්ඤකාක්ෂර, ඓතිහාසික, ශබ්ද විද්‍යාත්මක, සංයෝග, සන්නිවේදන, අක්ෂර

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර. සිංහල අධ්‍යයනාංශය.*